සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* 'අ' කොටසින් ප්‍රශ්න දෙකක් හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

## 'අ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** යාපහුව යනු පර්වතයක් ආශ්‍රිතව නිමවා ඇති අලංකාර බලකොටුවකි.

(i) යාපහුවේ දක්නට ඇති වාස්තු විද්‍යා නිර්මාණයක් නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) මෙහි පඩිපෙළ දෙපස යොදා ඇති සිංහ රූප දෙක පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) සමස්ත යාපහු වාස්තු විද්‍යා නිර්මාණය තුළ කැටයම් කලාව අලංකරණ මාධ්‍යයක් සේ යොදා ගෙන ඇත. ඒ පිළිබඳව පහත සඳහන් ශීර්ෂ ඔස්සේ විමසීමක් කරන්න.

(අ) යොදා ගෙන ඇති කැටයම් වර්ග

(ආ) නිරූපිත අවස්ථා

(ඉ) භාවිත ශිල්පක්‍රම

(ඊ) කලාත්මක අගය (ලකුණු 8 යි.)

**2.** පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී පොළොන්නරුවේ ඉදි වූ තිවංක පිළිමගෙය අනර්ඝ කලාගාරයකි.

(i) තිවංක පිළිමගෙයි අන්තරාලය තුළ දක්නට ඇති සිතුවම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) "මෙම පිළිමගෙය තුළ යුග දෙකක චිත්‍ර දක්නට ඇත." කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) බෝධිසත්ත්ව සංකල්පය හා එය ප්‍රකාශ කිරීම සඳහා යොදාගෙන ඇති සංරචන ආකෘතිය 'දේවාරාධනාව' චිත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 8 යි.)

**3.** ශ්‍රී ලංකාවේ ලෙන් විහාර අතර විශාලතම ලෙන් විහාරය වන දඹුලු ලෙන මහනුවර යුගයට අයත් චිත්‍ර, මූර්ති ගණනාවකින් යුතු කෞතුකාගාරයකි.

(i) දඹුලු විහාරයේ ලෙන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) 'දඹුලු විහාර සංකීර්ණය තුළ විවිධ ඉරියව් නිරූපිත බුදුපිළිම දක්නට ඇත.' කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) දඹුලු විහාරය තුළ දක්නට ඇති සුවිසල් බිත්තියක් වියන් සිතුවමක් වන 'මාර පරාජය' සිතුවම පිළිබඳ පහත සඳහන් ශීර්ෂ ඔස්සේ විග්‍රහයක් කරන්න.

(අ) ශිල්පීය දායකත්වය

(ආ) සංරචන ආකෘතිය

(ඉ) ප්‍රකාශනය

(ඊ) ශිල්පීය කුසලතාව (ලකුණු 8 යි.)

[දෙවැනි පිටුව බලන්න.

## 'ආ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** ආන්ද්‍රා දේශයේ පිහිටි අමරාවතිය යනු වාස්තු විද්‍යා, මූර්ති හා කැටයම් යන කලා අංගවලින් පිරි බෞද්ධ මධ්‍යස්ථානයකි.

(i) අමරාවතී ප්‍රදේශයෙන් හමුවන වෘත්තාකාර කැටයම් පුවරු **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ''අමරාවතී කැටයම් අතර බුදුන් වහන්සේ මානව ස්වරූපයෙන් දැක්වූ මෙන්ම **නොදැක්වූ** කැටයම් ද දක්නට ඇත.'' කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) බුද්ධ චරිතයේ වැදගත් අවස්ථා සතරක් නිරූපිත කැටයම් සහිත කුලුනක් හමුවී ඇත. එම අවස්ථා සතර විස්තර කර, ඒ එකිනෙකෙහි ආකෘතිය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

**5.** ඉන්දීය චිත්‍ර කලාවට අගනා මෙහෙවරක් ඉටු කළ ශිල්පීන් තමන්ට අනන්‍ය වූ ශෛලීන් ඔස්සේ එරට චිත්‍ර කලා සම්ප්‍රදාය පෝෂණය කර ඇත.

(i) රාජා රවි වර්මාගේ නිර්මාණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) නවජීවන ව්‍යාපාරයේ ශිල්පියෙකු වූ නන්දලාල් බෝස්ගේ චිත්‍ර පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) ''අම්රිතා ශෙර්ගිල්, තම චිත්‍ර මගින් ඉන්දීය ජන ජීවිතය පිළිබඳ විග්‍රහයක යෙදෙයි.'' මෙම ප්‍රකාශය පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ විමසන්න.

(අ) ආභාසය

(ආ) වස්තු විෂය

(ඉ) ශෛලීය ලක්ෂණ

(ඊ) වර්ණ භාවිතය (ලකුණු 8 යි.)

## 'ඉ' කොටස
## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**6.** 20 වැනි සියවසේ යුරෝපයේ බිහිවූ 'ඝනිකවාදය' විප්ලවීය වෙනසක් ඇති කළ කලා සම්ප්‍රදායකි.

(i) පිකාසෝගේ මුල් අවධියේ නිර්මාණ යුග දෙකකට බෙදා දැක්විය හැකිය. එම යුග **දෙක** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) පිකාසෝගේ නිර්මාණ කාර්යය කෙරෙහි අප්‍රිකානු නීග්‍රෝ මූර්ති මගින් ඇති කළ බලපෑම පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

(iii) පිකාසෝගේ ඝනිකවාදී සිතුවම් අතර සංස්ලේෂණවාදී හා විශ්ලේෂණවාදී කෘති දැකිය හැකිය. ඒ පිළිබඳව උදාහරණ සහිතව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

**7.** ග්‍රීකයෝ පුරාණයේ සිටම මූර්ති, වාස්තු විද්‍යා සහ මැටි බඳුන් කර්මාන්තය යන ක්ෂේත්‍රයන් හි විශිෂ්ටයෝ වූහ.

(i) ග්‍රීසියේ පෞරාණික යුගයට අයත් මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) ග්‍රීසියේ පාතිනොන් දේවස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) ග්‍රීසියේ ප්‍රචලිතව පැවති මැටි බඳුන් කර්මාන්තය පිළිබඳ පහත සඳහන් ශීර්ෂ ඔස්සේ විමසීමක් කරන්න.

(අ) භාවිත කිරීමේ අරමුණු

(ආ) බඳුන් තනාගත් අයුරු

(ඉ) සැරසිලි කිරීමේ ශිල්ප ක්‍රම

(ඊ) කලාත්මක අගය

(ලකුණු 8 යි.)

***